
# ගුහාවේ අභිරහස



දහම්ලි රත්නායක

# ගුහාවේ අභිරහස

## දහම්ලි රත්නායක

(කතෘ)

## කතෘගේ වෙනත් කෘති

- අපේ ගෙදර තැනූ පුංචි කුරුළු කූඩුව
- විශාඛා මහෝපාසිකාව
- ඇනාගේ කාලතරණය සහ මායා රජුගේ ඉරණම

මහාමායා බාලිකා විද්‍යාලය

9 - C

2026.05.10

**ISBN**

978-624-211-394-4

# පිදුම

මෙම පොත ලියා සාර්ථකව නිම කිරීමට මට අවශ්‍ය පෙළඹවීම, දිරිගැන්වීම හා සහයෝගය ලබාදුන් මගේ පවුලේ අයටද, සෑම වසරකම මෙන්ම මේ වසරේදීත් පොත් ලිවීමට අපට අවස්ථාව ලබා දුන් සෙනෙවිරත්න ගුරුපියාණන්ටත්, මෙම කර්තව්‍යට උර දෙමින් කටයුතු කරන මහාමායා බාලිකා විද්‍යාලයේ ගරු විදුහල්පතිතුමිය වන ශශිකලා සේනාධීර ගුරුමෑණියන්ටත්, විශාල වෙහෙස මහන්සියක් දරමින් යහපත් දරු පිරිසක් සමාජයට දායාද කිරීමට නිතරම වෙහෙසෙන, අපගේ දුක සැප සොයා බලා අපව ආදරයෙන් රැක බලා ගන්නා 9 - C ශ්‍රේණියේ පන්තිභාර ගුරුතුමිය වන සාවිත්‍රි මහේශිකා ගමගෙදර ගුරුමෑණියන්ටත් මේ පොත ලිවීමේදී විවිධ අදහස් එක්කල මාගේ ආදරණීය යෙහෙළියන්ටත්, මේ පොත කියවන පාඨක ඔබටත් මම මේ පොත සාදරයෙන් පිළිගන්වමි.

# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන "හේමමාලා උපහාර" ගත්කරණ ව්‍යාපෘතිය නැවුම් හැඩකි. දශකයක් තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයකි.

මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරදර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ද ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.

මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුවරුන්ට ඇතුළු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාදීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සලකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් තවදුරටත් ඉහළ නංවාගැනීමට හැකියාව ලැබේ.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.


සරත් බී. එස්. අභයකෝන්

ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත

සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය


2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන් සහ සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් ඇතුළු සියලු දෙනාගේ උතුම් ප්‍රයත්නය අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ.

ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල

දියවඩන නිලමේ

ශ්‍රී දළදා මාලිගාව

2026.05.10

# පටුන


පිටු අංකය

1.නත්තල් නිවාඩුව 01 - 06

2.ගල් ගුහාව හමුවීම 07 - 08

3.ගුහාව ඇතුලට 09 - 12

4.ගුහාවේ අවසානය 13 - 15

# නත්තල් නිවාඩුව

ඔන්න ඉතින් ඉස්කෝලේ නිවාඩු දෙන දවසත් උදා වුණා. හැමෝම එදා හොඳට විනෝද වුණා. ඒත් පාසල ඉවර වෙන වෙලාව ළං වෙනකොට යාළුවන්ගෙන් වෙන් වෙනවා කියලා මතක් වෙනකොට සමහරුන්ට නම් ඇඬුණා.

ඒත් අපේ යාළුවෝ හතර දෙනෙකුටනම් හරිම සතුටුයි. මොකද කියනවානම් එයාලා මේ පාර කැතීගේ සීයාගේ ගොවිපලට යන්නයි ඉන්නේ. කැතීගේ සීයා එයාට කියලා තියෙන හැමදේම වගේ කැතී එයාගේ යහළුවන්ට කියලා තිබුණා. එහේ පිහිටලා තියෙන ගල් ගුහාවක අතීත රජ කෙනෙකුට අයිති නිධානයක් වළලලා තියෙන කතාවක් හැමෝගේම සිත ඇද ගත්තා. ඉතින් මෙයාලා මේ ගමන යන්නේ හරිම ලස්සන බැලූ පැටියෙකුත් එක්ක. එයාව අයිති කැතීට. එයාගේ නම සින්ඩි.

ඉතින් ඔන්න අපේ යහළුවෝ හතරදෙනා පහුවදා උදෙන්ම ගොවිපලට යන්න ලෑස්ති වුණා. ඉතින් මේ ශීත ඍතුව නිසා ගොවිපල පිහිටා තිබෙන ප්‍රදේශය හිමෙන් වැහිලයි තියෙන්නේ. ඒ නිසා එයාලා හිමේ යාමට අවශ්‍ය හිම පාවහන් හා සීතලට අඳින හිම කබා කිහිපයකුත්, අවශ්‍ය වේවි කියලා හිතෙන වෙනත් දේවලුත් අරගත්තා. ඔය අතරේ කැතී ගිහින් සීයාගෙන් එයාලා නැවතී සිටීමට යන නිවාඩු නිකේතනයේ යතුර ඉල්ලා ගත්තා. එතකොට සීයා කිවුවා,

"ඒ නිවාඩු නිකේතනයේ ගබඩා කාමරයේ සහ ශීතකරණයේ ඔයාලට අවශ්‍ය කෑම බීම ඇති වෙන්න තියෙනවා. ඔයාලා ඇති තරම් විනෝද වෙලා එන්න. ඒත් අර මම කියලා තියෙන ගුහාවටනම් යන්න එපා. මොකද කියනවානම් ඒ ගුහාව ඇතුළට ගිය අයගෙන් දෙන්නෙක් හැර අනෙක් කිසිවෙක් නැවත ඇවිත් නෑ. මම දන්නවානේ ඉතින් ඔයාගේ හැටි, මගේ පුංචි සුරංගනාවියේ. ඔයා හරි ආසයිනේ ඔය වගේ අභිරහස් හොයන්න. ඒත් මම නම් කැමති නැහැ ගුහාව ඇතුළට යනවාට. හරී... දැන් ඉතින් ඔයාලා පරිස්සමින් ගිහින් එන්න"

ඔය අතරේ කැතීගේ යාළුවෝ එයාලගේ බඩුමුට්ටු ටික එයාලා යන වාහනේට පැටෙව්වා. කැතී සීයා දුන්න යතුරත් අරන් දුවගෙන ඇවිත් එයත් යාළුවන්ට බඩු ටික වාහනේට පටවගන්න උදවු කලා. දැන් ඉතින් එයාලා පිටත්වෙන වෙලාවත් ආවා. එයාලා දෙමව්පියන්ගෙන් සමුගෙන වාහනයට නැග්ගා. චිරි චිරි හඬ නංවමින් වාහනය පිටත් වුණා.

පැය හතරක් පමණ කාලයකින් පසුව ඔවුන් ගොවිපල පිහිටා තිබෙන ප්‍රදේශයට ලඟා වුණා. පාරක්වත් සොයාගන්න බැරි තරමට ඒ ප්‍රදේශය හිමෙන් වැහිලා. බලන්න ලස්සනයි. ඉතින් දැන් එයාලා ගොවිපල ජේනමානයට ඇවිත්. සින්ඩිටත් තේරුණා එයාලා ගොවිපලට ඇවිත් කියලා. ඒ නිසා ඌ සතුටින් බුරන්න පටන්ගත්තා. කැතී ඌව නිශ්ශබ්ද කරන්න ගත්ත උත්සාහයෙන් වැඩක් වුණේ නෑ. සින්ඩිට ඒක ඇහුණේවත් නෑ.

නිවාඩු නිකේතනය ඉදිරිපිට වාහනය නතර කලා. වාහනයේ දොර අරිනකොටම සින්ඩි සතුටින් බුරාගෙන එළියට පැන්නා. අනේ ඉතින් ඌ හිමේ එරුණා.



ඔන්න ඉතින් අපේ යාළුවෝ ටික වාහනයේ තිබුණු ඔවුන්ගේ බඩු නිවාඩු නිකේතනය ඇතුළට ගත්තා. සියලු දේ කරලා අවසන් කළාට පස්සේ එයාලා පැමිණි වාහනයේ රියදුරාට ස්තූති කරලා පිටවෙලා නොපෙනී යනතුරු බලාගෙන ඉඳලා නිකේතනය ඇතුළට ගිහින් දොර වසා ගෙන ඔවුන් ගෙනා බඩු බාහිරාදිය තම තමන්ගේ කාමර තුළට ගත්තා. සවස් වෙලා නිසා එයාලා කෑමට අවශ්‍ය දේවල් අරගෙන රාත්‍රී ආහාරය පිළියෙල කරන ගමන් ඔවුන් සියලු දෙනා තේ හදාගෙන බිවුවා. තේ බීලා ඉවර වෙලා ගමන් මහන්සිය නිසා එයාලා පොඩ්ඩක් නිදාගත්තා.

ටික වේලාවකින් එයාලා අහැරිලා, ඔවුන් පිළියෙල කළ රෑ කෑම කලා සතුටු සාමිච්චියේ යෙදුනා.

“හෙට අපි හිමේ සෙල්ලම් කරමු”

ඩයනා කිවුවා. අතිත් හැමෝම ඒකට එකඟ වුණා. ඉන්පසුව ටික වේලාවක් කාඩ් සෙල්ලම් කිරීමෙන් පසු නින්දට ගියා.

# ගල් ගුහාව හමුවීම

ගමන් මහන්සිය නිසා එදා රාත්‍රියේ ඔවුන්ට තදින්ම නින්ද ගියා. පහුවදා උදේ මුලින්ම ඇහැරුණේ හැරී. ඉතින් එයා අනිත් අයවත් ඇහැරවගෙන උදේ කෑම ලෑස්ති කළා. කෑමට තිබුණේ, ඔවුන් ගෙදරින් පැමිණෙන විට ගෙන ආ එළකිරි සහ ශිතකරණයේ තිබුණු මස් පෙති රෝස් කර අල කිහිපයක් තම්බා සකස් කරගත් ආහාරයක්. ඔවුන් ආහාර ගැනීමෙන් පසු කෑම මේසය පිරිසිදු කර, හිමේ සෙල්ලම් කිරීමට එළියට ගියා.

"ඔයාලා දන්නවාද? මේ ළඟමයි මුහුදත් තියෙන්නේ, අපි ඕනනම් හෙට හරි අනිද්දා හරි ඒ පැත්තේ යමු"

කැතී කිවුවා. හැමදෙනාම ඒකට එක පයින්ම කැමති වුණා.

ඉතින් මෙයාලා මුළු දවසම වගේ හිමේ සෙල්ලම් කළා. දවල්ට කන්නත් කට්ටියට අමතකයි. ඉතින් මෙයාලා හිමේ ඇවිදිද්දි එකපාරටම විලියම් අනිත් අයට කතා කළා. අනිත් අය එතනට ඇවිත් ඇහුවා ඇයි කතාකළේ කියලා.

"මේ බලන්න ගල් ගුහාවක්. ඒක ඇතුළට යන්න පුළුවන්. හිමෙන් වැහිලා තිබුණු නිසා අපි ඒක කලින් දැක්කේ නෑ"

විලියම් කිවුවා.

"අහ්, මේක වෙන්න ඕනේ අපේ සීයා කිවුවේ. අපි ළඟමනේ බලාගෙන ගියාම තියෙන්නේ. ඔයාලට මම මේක ගැන වැඩි විස්තර කියලා නෑ. තව විස්තර ගොඩක් තියෙනවා කියන්න. අතනට යමුකෝ. මම මේ ගල් ගුහාව ගැන විස්තර කියන්නම්"

කැතී එසේ කීවා ය. ඉන්පසු සියලු දෙනාම ඒ අසළ තිබූ ගස් කොටයක් මත වාඩි වුණා. කැතී කතාව පටන් ගත්තා.

"අපේ සීයා කියලා තියෙනවා මේ ගල් ගුහාව හරිම අත්භූතයි කියලා. එයා මේ ගොවිපලේ ජීවත් වෙන කාලේ එයා රෑට තනියම එළියට ගිහින් ඉද්දි අමුතු අමුතු ආලෝක ගුහාව ඇතුළෙන් පේනවාලු. මෙතනදී විශේෂයෙන්ම කියන්න ඕනේ අපේ සීයා හොල්මන් විශ්වාස කරන්නේ නැහැ. ඒත් එයා එයාගේ ඇස් දෙකටම ඒ එළිය දැකලා තියෙනවා. ඒ වගේම ඒ කාලේ මේ ගොවිපලේ ගොඩක් මිනිසුන් ඉඳලා තියෙනවා. ඒ මිනිසුන් අපේ සීයාට කියලා තියෙනවා රෑට එක එක බහුබූත සද්ද බද්ද ඇහෙනවාත් කියලා.

මිනිසුන් කිහිප වතාවක් මේ ගුහාව ඇතුළට ගිහින් තියෙනවා. ඒත් ගියපු දෙන්නෙක් හැර අනෙක් අය නැවත ඇවිල්ලා නැහැ. ඉතින් ඒ ආපු දෙන්නත් ගුහාව ඇතුළට වැඩි දුරක් ගිහින් නෑ. එයාලාට දැනිලා තියෙනවා කවුදෝ කෙනෙක් එයාලගේ පිටිපස්සෙන් එනවා වගේ. කවුදෝ ඒ එක්කෙනෙක්ගේ අතකින් ඇද්දාලු. එයාලා කලබලවෙලා දුවගෙන එද්දි දෙන්නම ඇඳගෙන වැටිලා. ඒ දෙන්නා ගෙදර ඇවිත් මාසයක් විතරම වචනයක්වත් කතා කරලා නෑ. හොඳටම දුර්වල වෙලා. එයාලා මාස තුනකින් විතර මැරුණාලු. මේ ගුහාවේ

තමයි අර අපිට සීයා කියපු, කලින් හිටපු රජ කෙනෙක්ගේ නිධානයක් තියෙනවා කියන්නේ. සමහරවිට ඒ නිධානය ආරක්‍ෂා කරන බහිරවයෙක් ඇති''

කැතී කතාව ඉවර කරද්දි හැමෝම ගල් ගැහිලා වගේ බලාගෙන හිටියා. විනාඩි කිහිපයකට පස්සේ හැරී කිවුවා,

''අනේ අපි හෙට යමුද ගුහාව ඇතුළ බලන්න. බයවෙන්න දෙයක් නෑ, අපේ සින්ඩිත් ඉන්න නිසා.කාටවත් අපිව ලේසියෙන් නවත්තන්න බැහැ.''

හැරී නිර්භීතව කිවුවා.

''ඒක තමයි මාත් හිතුවේ. අපි යමුද? ''

එහෙම කිවුවේ ඩයනා.

ඔන්න ඉතින් කට්ටිය කතා වුණා පහුවදා උදෙන්ම මේ ගුහාව ඇතුළ බලන්න යන්න.

දැන් හවස් වෙලා නිසා එයාලා නිවාඩු නිකේතනයට ගිහින් හිම කබා ගලවලා ගිනි උදුන ළඟ වාඩි වෙලා හෙට යන්න ඉන්න ගමන ගැන කතා වුණා.

# ගුහාව ඇතුලට

ඉතින් පහුවදා උදෙන් ම මෙයාලා අවශ්‍ය බඩු මුට්ටු සාදා ගත්තා. ගබඩා කාමරයේ තිබුණු ලණු, ටෝච්, ඉටිපන්දම්, ගිණි පෙට්ටි, ප්‍රථමාධාර ද්‍රව්‍ය, ඔරලෝසුවක් සහ අවශ්‍ය වේවි කියලා හිතෙන දේවල් ටිකක් මල්ලකට දා ගත්තා. ඒ වගේම තව දවස් දෙකකට විතර හරියන්න කෑම බීමත් අරගත්තා.

දැන් මෙයාලා ගුහාව ඇතුළට යන්න පිටත් වුණා. හිතුවේ නැති තරම් ගුහාව අඳුරුයි. ඉතින් මෙයාලා ටෝච් එක පත්තු කරගෙන ගුහාව ඇතුළට ගියා. ඉතින් මේ අය පැයක් විතර එක දිගට ගුහාව ඇතුළට යනවා. දැන් මෙයාලාට හොඳටම මහන්සියි. එයාලා ටිකක් මග නැවතිලා විවේක ගත්තා. ඊට පස්සේ ආපහු ගමන ආරම්භ කළා.ඔහොම යනකොට යනකොට මෙයාලාට එකපාරටම ලොකු සද්දයක් ඇහුණා. ඒ ශබ්දය ගුහාවේ දෝංකාර දුන්නා. ඩයනා බයවෙච්ච පාර විසිවෙලා ගිහින් බිම වැටුණා. ඩයනා වැටුණු පාර අතේ වැලමිට ළඟ පොඩ්ඩක් තුවාල වෙලා. ඉතින් එයාලා අතට බෙහෙත් දාලා ආපහු ගුහාවේ ඉදිරියට යන්න පටන් ගත්තා. ඉතින් මෙයාලා දැන් මේ අය ගුහාවේ ඇතුළට කිලෝ මීටර් තුනක් විතර ම ඇවිත්

මෙයාලාට දැන් හොඳටම බඩගිනියි .ඒ නිසා මෙයාලා ටිකක් නැවතිලා කෑම කෑවා .

අනේ මටනම් තව ඇවිදින්න බෑ. අපි ටිකක් මෙතන ඉඳලා යමු.

එහෙම කිවුවේ විලියම්හැමෝටම ගමන් මහන්සිය දැනුන නිසා හැමෝම ඒ . .මෙයාලා එතන ඉඳගෙන විවේක ගද්දී හැමෝටම නින්ද ගියා .කතාවට එකඟ වුණා.

ඉතින් මෙයාලා පැය හයක් විතර නිදාගෙන ඉඳලා ඇහැරුණා.

මම හිතන්නෙ දැන් හුගක් රෑ වෙලා

ඒහෙම කියලා කැතී ඔරලො ්සුව දිහා බැලුවා. වෙලාව හවස 7.00 වෙලා. ඉතින් මෙයාලා තව පැය දෙකක් විතර අ ැවිද්දා. දැන් මෙ ් හතර දෙනාට බඩගින්නකුයි, නිදිමතකුයි දැනෙන්න පටන් ගත්තා. ඉතින් මෙයාලා ගුහාවෙ ් හොඳ තැනක් බලලා ඒයාලා ගෙනාපු කෑමවලින් ටිකක් කාලා ටික වෙලාවක් කතාබහෙ ් යෙදිලා රෑ 9.00 විතර නිදාගත්තා.

පහුවදා උදේ මුලින්ම ඇහැරුනේ කැතී. එයා අනිත් අයවත් ඇහැරවගෙන උදේට කෑමත් කාලා ආපහු ගමනට පිටත් වුණා.

ඉතින් ඔන්න අාපහු මෙයාලා ගුහාවෙ ඉදිදිරියට යන්න පටන් ගත්තා. හිටි ගමන්ම හැරීගෙ කකුලට මොකක්දෝ අහුවුණා. හැරි බිම බලලා පුදුම වුණා. කතා කරගන්නත් බැරි වුණා.

”.හැමෝම මේ බලන්න“

අැටසැකිල්ලක් ?. මෙයාලා වෙන්න අැති අර ගුහාවට අැවිත් අතුරුදහන් වුණු අය.

ඒ ඩයනා.



මේ බලන්න.පොඩ්ඩක් ඉන්න“මේ මල්ලේ තියෙන ජාතිමැණික් ගල් නේද .?”

කැතී එහෙම කියද්දී හැමෝම පුදුම වුණා.

අපි මේවාගෙන් ටිකක් ගමුද“? දැක්කහම ආසයි අනේ”.

ඩයනා එහෙම කියද්දී විලියම් ඊට විරුද්ධ වුණා .

ඒ .ඒක නිසා අපිට මේවා ගන්න බැහැ .මේ වස්තූන් අපිට අයිති දේවල් නෙවෙයි“ වගේම ඒ අත්භූත ගල් ගුහාවේ තිබෙන ඇටසැකිලිත් මේවා ආරක්ෂා කරනවද කවුද දන්නේ? ඒක නිසා කවුරුත් මේවා ගන්න එපා”.

ඉතින් කට්ටිය තවත් ඉස්සරහට යනකොට ටෝච් එකේ එළිය අඩු වුණා .

ඉතින් තවත් විනාඩි දෙකක් විතර ගත වෙද්දී ටෝච් එක නිවිලා ගියා .

.අපි දැන් මොකද කරන්නේ ටෝච් එකත් ඉවරයි‘‘දැන් ඉතුරු ගිනිපෙට්ටියි , ’’ඉටිපන්දමුයි විතරයි
හැරී එහෙම කියද්දී කැතී ඒ කතාව අනුමත කළා .

.අපිට ආපස්සට හැරිලා යන්නත් බැනේ අපි ටික වේලාවක් මෙතන ඉමු .ඔව්‘‘ මෙතනින් එහාට අපි කිසිම එළියක් නැතිව යන්න .එතකොට අපේ ඇස් අඳුරට හුරුවෙයි අවශ්‍ය වුණොත් විතරක් ඉටිපන .බලමු්දමක් දල්වමු’’.

හැමෝම ඒ කතාවට එකඟ වුණා .ඉතින් එයාලා එතන විනාඩි කිහිපයක් හිටියා . .අඳුරට ඇස් හුරු වුණාට පස්සේ ආපහු ගමන පටන් ගත්තා

ඉතින් මේ අය ඔහොම යනකොට යනකොට එකපාරම සින්ඩිගේ හැසිරීම අමුතු වුණාකුමක් හෝ දෙයක් සොයා .ඌ එකපාරම දගලන්නත් බුරන්නත් පටන් ගත්තා . ගත්තා වගේ සතුටින් උඩ පනින්නත් පටන් ගත්තා .

මෙතන .ඉක්මනට කවුරු හරි ඉටිපන්දමක් දල්වන්න .හා හා සින්ඩි මොකද මේ‘‘ ’’.මොකක් හරි තියෙනවා වගේ

කැතී එහෙම කියද්දී හැරී ඉටිපන්දන දැල්වුවාහැමෝම පුදුමයෙන් ඇස් අදහාගත . .නොහැකිය තුස්නිම්භූත වෙලා වගේ හිටියා

පිහියක් මේ !බලන්නඔය ඉටිපන්දම ලං කරන්නකෝ මේ පිහියේ කළු පාටට . තියෙන්නේ ලේ නේද? ඒ කියන්නේ මෙතන පිහි ඇනුමක් වගේ දෙයක් සිදු වෙලා තියෙනවාඑතන තිබුණ එක මැණිකක් ,ඔයාලට මතකද අර ඇට සැකිල්ල ,මේ අහන්න . ඒ මැණිකෙත් මේ වගේ කළුපාට මොනවදෝ .මම අහුලාගෙන හොඳින් ඒක දිහා බැලුවා මම හිතන විදිහට නම් අර අපිට හමු වුණ .ඒ වගේ මේ පිහියෙත් තියෙනවා .ගැවිලා තිබුණා ඇටසැකිල්ල අයිති මිනිහා කවුරු හරි මේ පිහියෙන් ඇනලා මරලා ගුහාවෙන් පිටතට පැමිණෙන්න එද්දී පිහිය මෙතන වැටෙන්න ඇතිදෙදෙනා අතර ඇති වුණු ගැටුමේදී ඒ . ඒ නිසා අමාරුවෙන් මේ ටික ඇවිදගෙන ඇවිත් අතන .මිනිහටත් තුවාල වෙන්න ඇති .අමාරු වෙලා ඔවුන් එතනම මැරෙන්න ඇති .ඉදගන්න ඇති

හැම දෙනාටම හරිම පුදුමයි.

මේ සිදුවෙන දේවල් වල හැටියට ඉදිරියේදී තව මොන මොනා දේවල් වලට ‘‘ ’’.මුහුණු දීමට සිදු වෙයිද දන්නේ නැහැඩයනා කිව්වාඔව් මමත් ඒ ‘‘ එතකොට හැරී කිව්වා . ’’.කතාව නම් පිළිගන්නවාඅපි බලමු තව ඉස්සරහදී මොනවා තියෙයිද කියලා ’’.

ඉතිං හැමෝම හිතේ බලාපොරොත්තු තියාගෙන තවත් ඉදිරියට ගියාදැන්නම් . වතුරනම් .වතුරත් ඉවර වෙන්න ළඟයි ,කෑමත් .මෙයාලට ඉවසගන්න බැරි තරම් බඩගිනියි

ඒ හින්දා එයාලා ගෙනාපු බිස්කට් වලින් එක්කෙනෙක් දෙක .ඇත්තේ ඉතාමත් ස්වල්පයක් මොකද එයාගේ කෑම .සින්ඩිටත් හම්බවුණේ ඒ ගණනමයි .ගණනේ බෙදා ගෙන කෑවා ටිකක් ඉවර වේගෙන තමයි එන්නේ.ඉතිං එයාලා විනාඩි කිහිපයක් විවේක ගත්තා .

මමතුඅැ වහාගු .2ක් වෙනවා අපි මේ වෙනකොට මේ ගුහාව ඇතුලට ඇවිල්ලා දින“ ඒත් අපි අපේ අරමුණ කොහොම හරි ඉටුකර .මේන්නවා දැන් අපි හැම දෙනාටම මහන්සියි අපිට ඉදිරියේදී තව මොන .දැන් අපේ අරමුණ ගොඩක් සාර්ථක වෙලා තියෙන්නේ .ගනිමු මොන අභියෝගවලට මුහුණ දෙන්න වෙයිද දන්නේ නැහැඒත් අපට මොන අභියෝග . ”.ආවත් අපි අපේ අරමුණ කොහොම හරි ඉටු කර ගමු

ඩයනා එහෙම කියද්දී අනෙක් අයට අමුතු ධෛර්යයක් ආවාඉතිං මෙයාලා . .අධිෂ්ඨානශීලීව නැවත ගමන ආරම්භ කළා ,ධෛර්යය සම්පන්නව
ඉතිං දැන් මෙයාලා කළුවරේ තමයි යන්නේඔහොම යන .කොට ඩයනා කකුල වැදිලා මොකක් හරි දෙයක් විසිවෙලා ගිහින් ප්‍රපාතයකට වැටුණා වගේ ශබ්දයක් ඇහුණා . .හැමෝම ගල් ගැහුණා වගේ වුණා

”.ඉටිපන්දම දල්වන්න“විලියම් කිව්වා .

අර බලන්න ප්‍රපාතය පහල ඇටසැකිල්ලක් නේද !අහ් මේ බලන්න ප්‍රපාතයක්“ හරියටම පැහැදිලිව පෙනෙන් .පෙනෙන්නේනේ නැහැකැතී ඔයාගේ අර ලණුව . අපි ලණුව මේ ලොකු ගලේ හොඳින් ගැට ගහලා එක එක්කෙනා පහළට .ගන්නකෝ ඔයා .හැරී ඔයා අන්තිමට බහින්න .බහිමුබහිනකොට අර අපි බඩුකෑම වර්ග අරගෙන , පිටේ එල්ලගෙන පරිස්සමින් පහළට ,සින්ඩි ඒකට දාලා ,ආපු බෑග් එක දැන් හිස් නිසා ”.බහින්නකැතී එහෙම කිව්වා.

ඊට පස්සේ එක එක්කෙනා පිටුපස පරිස්සමට බිමට බහින්න පටන් ගත්තාමුලින්ම . එයා .අන්තිමට ම හැරී .තුන්වෙනියට ආවේ විලියම් .ඊට පස්සේ ඩයනා .බැස්සේ කැතී .සින්ඩිවත් පිටේ තිබුණු බෑග් එකේ දාගෙන තමයි ආවේ

එතකොට මේ ලණුව .අපිට සමහර විට මේ මාර්ගයෙන්ම ආපහු එන්න වෙයි“අපිට ඕන වෙයිඒ .සමහරවිට අපිට එළියට යන්න වෙනත් මාර්ගයක් හම්බවෙන්න පුළුවන් . ”.නිසා අපි මේ ලණුව ගැන වද වෙන්න ඕනි නැහැ

කැතී එහෙම කිව්වා.

ඒ ප්‍රපාතය පාමුල තිබුණා ඔලුව නැති ඇටසැකිල්ලක්ඉතින් මෙයාලා තව වටපිට . බලද්දී තමයි දැක්කේ ඒ ඇටසැකිල්ලේ හිස් කබල වෙන තැනකතියෙනවා.



ඉතින් මෙයාලා ඔහොම යනකොට යනකොට ඈතින් එළියක් දැල්වෙනවා පෙනුණා .හැමෝගේම පපුව ගැහෙන්න පටන් ගත්තා ..

# ගුහාවේ අවසානය

ඉතින් මෙයාලා සින්ඩිව ඉස්සරහට දාලා හැමෝම සින්ඩිගේ පිටිපස්සෙන් ගියා . විලියම් පිටිපස්ස හැරිලා .එළිය නිසා මුළු ගුහාවේම අඳුර නැති වුණා වගේ පෙනුණා ඉස්සරහින් පෙනෙන .එයාලා ආපු පාරෙත් ඒ ආලෝකය ඈතින් දිස් වුණා .බැලුවා .ආලෝකය දැන් හොඳටම ළඟයි

ඒත් ළං වෙද්දි කට්ටියටම තේරුණා ඒක බල්බ් එකක් කියලා .

මේක එකපාරම පත්තු වුණේ කොහොමද .මේක බල්බ් එකක්නේ .මේ බලන්න‘‘?’’


හැරී එහෙම කියද්දී කැතී කිව්වා.

ඒකෙන් වෙන්න ඇති .සමහරවිට ඉස්සරකාලේ දාපු සූර්ය පැනල ඇති ගුහාවේ උඩ‘‘ ’’.සීයා දැක්කා කියපු ආලෝකය මේක වෙන්න ඇති .මේවා වැඩ කරන්නේ



ඉතින් ඔහොම යනකොට යනකොට මේ අයට ඇහුණා වතුර එඬක්ඒක . හැරී බාරගත්තා මේ තැන සොයා බලා වතුරත් පුරවගෙන .ඇහෙන්නේ පොළව යටින් විලියමුයි ඒ වතුර හඬ ඇහෙන ,හැරියි .විලියමුත් හැරීත් එක්ක යන්න ඉදිරිපත් වුණා .එන්න .පැත්තට ඇවිදගෙන ගියා

අනෙක් අය ගුහාවේ ඉදිරියටම ගමන් කළාඔන්න එතකො .ට කැතී දැක්කා පරණ පොතක් වගේ දෙයක් බිම වැටිලා තියෙනවා .පෙනෙන හැටියට නම් ඒක මන්තර පොතක් . .පොත පෙරලලා බලද්දී තමයි දැක්කේ ඒක නිධන් ගන්න විධි ගැන ලියපු පොතක් කියලා



මෙයාලා එතන නැවතිලා පොත හොඳින් අධ්‍යනය කලාඑයාලට හැරීගේ සහ . විලියම්ගේ කටහඬ ඇහෙනකොට ආපහුගමනට සූදානම් වුණාහැරී ආවේ හැම . .බෝතලයකටම වතුර පුරවාගෙන
පොළොව යටින් ඇලක් වගේ වතුර .අපිට වතුර ගලන ශබ්දය ඇහුනේ පොළොව යටින්‘‘ ගුහාව එහා .ඒ වතුර පාර ගලන්නේ මුහුද තිබෙන දිහාවට .පාරක් ගලාගෙන යනවා .’’පැත්තෙන් මුහුද තිබෙන්නේ.

ඉතින් දැන් හැමෝටම සතුටුයි එයාලා ඇති .තරම් වතුර බීලා ආපහු ඉදිරියට යන්න පටන් ගත්තා.

මේක නිධාන ගන්න විධි ගැන මන්තර .හැරී ඔයා දන්නවද අපට හමුවුණ දෙය‘‘ අර මැරිලා හිටපු මිනිසුන් වෙන්න ඇති සමහරවිට මේ පොත ගේන්න් .තියෙන පොතක් ’’.ඇත්තේඩයනා එහෙම කිව්වා.

හැමෝම සතුටින් හිනාවෙවී කථා කර කර ගුහාවේ තවත් ඉදිරියට ගමන් කළා . මොකද දන්නවද එයාලා ඇති .මලානික වෙලා තිබුණු මුහුණු ටිකට දැන් එළිය වැටිලා තව ටික දුරක් මෙහෙම ඉදිරියට යනකොට ආපහු ගුහාවේ ගමන් .තරම් වතුර බීපු නිසා වම් පැත්තේ මාර්ගය ආරම්භයේ රෝල් කරන ලද .මාර්ගය ටිකක් එළියට වගේ පෙනුනා ඒක .කඩදාසියක් බිම වැටී තිබුණාදිග හැරලා බලද්දී හැමෝගේම මුහුණු ආලෝකමත් වුණා.

ඒක සිතියමක්එහි ලියා තිබූ දෙය විලියම් හැමෝටම ඇහෙන්න හඬනඟා . .එහි මෙසේ ලියා තිබුණා .කියෙව්වා

500ක් පමණ ගමන් මෙතැන් සිට මීටර් .දකුණු පැත්තේ ගමන් මාර්ගයේ නිධානයක් ඇත‘‘ ’’.කළ පසු එය දැක ගත හැකිවේවි

මේකේ තියෙන වි‘‘දිහට අපි එළියට යන්නේ මුහුද පැත්තෙන්අපි යමුකෝ . .අපි නිවාඩු නිකේතනයට ගිහින් මේ ගැන පොලිසියට කියමු .නිධානය තිබෙන දිහාවට අනාගතයේ කවුරුහරි මේ නිදානය අයිතිකරගන්නවට වඩා ඒක රජයට භාර දෙන එක ’’.ඔයාලාත් නිධානයේ තිබෙන කිසිම දෙයක් ගන්න එපා .හොඳයි

විලියම් එහෙම කියද්දී.හැමෝම ඒ කථාවට එකඟ වුණා ,

දැන් එයාලා වම් පැත්තෙන් ගමන් මාර්ගයෙන් ඉක්මනින් ගුහාවෙන් එළියට යාමට අදහස් කළාමෙසේ ඉදිරියට ගමන් .ඒ අනුව ඔවුන් ඒ මාර්ගයෙන් ඉදිරියට ගමන් කළා . ඒත් ගුහාවේ දොරකඩ විශාල .කරන කොට මේ අයට ගුහාවේ අවසානය පෙනුනා එම ස්ථානය හොඳින් පරීක්ෂා කිරීමේ .තැනකින් ආවරණය කර තිබුණාදී එක් අයෙකුට ඉතා අපහසුවෙන් යා හැකි පරිදි කුඩා ඉඩක් ඇති බව පෙනී ගියාමේ සියළු දෙනා එම කුඩා . .ඉඩෙන් ඉතා අපහසුවෙන් එළියට ආවා

.හැරී කිව්වා ''දැන් නම් හරි ලස්සනට ඇතින් මුහුද පේනවා''



මේ ගුහාවට ඇතුල්වුණු දෙන්නෙක් හැර ,ඔයාලා දන්නවද අපේ සීයා කිව්වා වෙනත් කිසිවෙකු එළියට ආවේ නැහැ කියලාමේ ගුහාව ඇතුළට ආ අය මෙතැනින් . මෙතනින් විතරක් නොවෙයි මුහුදු .පැනලා යන්න ඇතිමාර්ගයන් හරහාත් ඔවුන් යන්න ඇති ''.හැරී කිව්වා .

ඉතින්''ඇයි එයාලා රටින් පැනලා යන්නේ.ඒ ඇහුවේ ඩයනා ''

එයාලට මේ නිධානය ගැන අනෙක් අයට ,මොකද කියනවානම්''විස්තර කියන්න වෙනවානේද .ඒ වගේම සමහරු මේ අයට තර්ජනය කර හිංසා කිරීමටත් පුළුවන් .?කැතී '' .උත්තර දුන්නා

.විලියම් කිව්වා ''ඔව් සමහර විට වෙන්න පුළුවන්''

මේ ,දැන් ඉතිං ඉක්මනින් ගිහින් අපේ සීයට කියලා .දැන් අපි මුහුදත් බලාගත්තා'' ඒක නිසා අ .බව පොලීසියට දැනුම් දෙමුපි හෙටම නිවාඩු නිකේතනයෙන් පිටත් වෙලා යමු නේද? ඩයනා කිව්වා.හැම දෙනාම එම අදහසට එකඟ වුණා .

සියළු දෙනාම ඉතාමත් සතුටින් නිවාඩු නිකේතනයට ආවා. ඇවිල්ලා හෙට ඔවුන්ගේ අරමුණ ඉටුකර ගැනීමට හැකි වීම ගැන .උදෑසනම ආපසු යාමට සූදානම් වුණා සහ ඔවුන් සිදු කළ උතුම් ක්‍රියාව පිළ ිබඳව සියළු දෙනාටම ඉතාම සතුටුයිඔවුන් සියළු . .දෙනාම ඔවුන් පිළිබඳව ඉතාමත් ආඩම්භර වුණා

නිමි.

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කරවීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොත් පත ද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවකුට ලැබෙන ආශ්වාදය අන් කිසිවකින් වත් ලබා දිය නොහැකි නිසාය. තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොත පතින් දරුවන් දුරස් වීම වළක්වා ගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහා මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථ කරන ව්‍යාපෘතිය ව්‍යාපෘතිය දියත් වේ. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි. මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද දියවඩන නිලමේ තුමන් ඇතුළු සිව් දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාරය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහ ලේකම්

(ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN**

978-624-211-394-4